**2019.06.24 වන දින පෙ.ව. 10.00 ට පමණ සීතාවක ප්‍රාදේශීය සභා කමිටු ශාලාවේදී පවත්වන ලද නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීමේ වාර්තාව.**

**සහභාගී වූ :**

1. ගරු කාරක සභා සභාපති - කේ.ඒ.විමල් ප්‍රිසන්න මැතිතුමා
2. ගරු කාරක සභික - ඇම්.ඒ. මේරි මාග්‍රට් මැතිතුමිය
3. ගරු කාරක සභික - ඩී. කෝකිල සම්පත් වර්ණසිරි මැතිතුමා
4. ගරු කාරක සභික - ඩී. ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා
5. ගරු කාරක සභික - ඩබ්.ඩී. චින්තක දේවින්ද සමරවීර මැතිතුමා
6. ගරු කාරක සභික - ඩී.ඩී.අයෝම මධු ප්‍රසාද් දේවගේ මැතිතුමා
7. ගරු කාරක සභික - ඇම්.ඩී. මාලනී චන්ද්‍රලතා මැතිතුමිය
8. ගරු කාරක සභික - ඥාණ ප්‍රකාසම් ෆ්‍රැන්සිස් මැතිතුමා

**සහභාගී නොවූ**

1. ගරු කාරක සභික - එස්.ඒ. පෙරේරමරත්න මැතිතුමා
2. ගරු කාරක සභික - දනුෂ්කි ප්‍රණභානි අල්මේදා මැතිතුමිය
3. ගරු කාරක සභික - එස්. චන්ද්‍රාකුමාර් මැතිතුමා

**සහභාගී වූ නිලධාරීන් :**

1. ලේකම් - කේ.ඒ චන්දන පද්මසිරි මයා
2. ප්‍රධාන කළමනාකරණ සහකාර - කේ.ඩී. සන්ධ්‍යා මාලනී මිය
3. වැඩ අධිකාරී - ජයන්තා ජල්තොටගේ මිය
4. පුස්තකාලයාධිපති - හංවැල්ල - එස්.එම්. රංජනී මිය
5. පුස්තකාලයාධිපති - පාදුක්ක - එම්.ජී. චන්ද්‍රමරත්න මයා
6. ප්‍රධාන සංවර්ධන නිලධාරී - කේ.ජී. ශර්මිලා දූෂානි මිය
7. සංවර්ධන නිලධාරී - ඩී.ජී. ඉෂානි කමලිකා මිය
8. පුස්තකාල සහායක - කහහේන - එම්.ඩී. දූලිකා ලක්මිණි මිය
9. පුස්තකාල සහායක - කොස්ගම - කේ.පී. කුමුදිනී ප්‍රියන්තා මිය
10. සෞඛ්‍යස කම්කරු - එච්.ඒ. වත්සලා විනෝදනී

නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවට පැමිණි සියලු මන්ත්‍රීවරුන් හා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය සාදරයෙන් පිළිගත් ගරු කාරක සභා සභාපතිතුමා කාරක සභාවේ කටයුතු ආරම්භ කරන ලදි.

## 01. ලිපි ලේඛණ සලකා බැලිම.

1. ප්‍රජා සංවර්ධන නිළධාරී විසින් "හංවැල්ල පෙර පාසල සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සම්බන්ධවයි." යන හිසින් යුතුව 2019.06.18 දිනැතිව ගරු සභාපතිතුමාගේ උපදෙස් පරිදි 2020 වර්ෂයේ සිට හංවැල්ල පෙර පාසල තුළ දිවා සුරැකුම් මධ්‍යලස්ථානයක් ආරම්භ කිරීම සඳහා පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් උපදෙස් හා අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලමින් යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, බඳවාගනු ලබන දරුවන් ගණන සීමිත බැවින් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා පමණක් අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සමඟ සාකච්ඡා කර තීරණයකට එළඹීම සුදුසු බවට තීරණය කරන ලදි.

   i. දැනට පෙර පාසලේ ළමුන් 54 ක් ඉගෙනුම ලබන අතර දිවා සුරැකුම් මධ්‍ය.ස්ථානයක් ආරම්භ කරන්නේ නම් පෙර පාසල් ළමුන් ගණන 40 ට සීමා විය යුතු බව
   ii. දිවා සුරැකුම් මධ්‍ය ස්ථානය සඳහා ළමුන් 10 ක් සීමා විය යුතු බව
   iii. දිවා සුරැකුම් මධ්‍ය ස්ථානයේ සේවා කාලය පෙ.ව. 7.30 සිට ප.ව. 5.00 දක්වා විය යුතු බව
   iv. දිවා සුරැකුම් මධ්‍යරස්ථානය සඳහා සේවකයන් දෙදෙනෙකු යෙදවිය යුතු බව
   v. පෙර පාසල සඳහා තවත් එක් ගුරුවරියක් බඳවාගත යුතු බව
   vi. දිවා සුරැකුම සඳහා අවශ්‍යව අනෙකුත් අවශ්‍යතා ඉටුකර දිය යුතුය. (උපකරණ හා වැසිකිළි පහසුකම්)

2. පාදුක්ක, අංගමුව, Unity of Youth ක්‍රීඩා සමාජය, සභාපති විසින් "ප්‍රජාශාලාව ලබාගැනීම සම්බන්ධව" යන හිසින් යුතුව 2019.06.04 දිනැතිව අංගමුව ප්‍රජා ශාලාව කලක පටන් අබලන් තත්වයේ පවතින අතර එය දිගු කාලයක සිට කිසිඳු ප්‍රයෝජනයක් ගත නොහැකි ආකාරයෙන් වසා දමා ඇති බැවින් ගමේ සුභසාධනය උදෙසා ප්‍ර.තිසංස්කරණය කොට අංගමුව ක්‍රී ඩා සමාජයේ වැඩකටයුතු සඳහා ලබාදෙන ලෙස ඉල්ලමින් යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා පාදුක්ක තාක්ෂණ නිළධාරී වාර්තාවක් ලබාගැනීමටත්, අංගමුව ප්‍රජා ශාලාව සංවර්ධනය කිරිම සඳහා සීතාවක ප්‍රාදේශීය සභාව වෙත පවරා දෙන ලෙස ඉල්ලා ලිපියක් පාදුක්ක ප්‍රාදේශීය ලේකම්තුමා වෙත යැවීමටත් තීරණය කරන ලදි.

3. හංවැල්ල පිලිප් ගුණවර්ධන අනුස්මරණ මහජන පුස්තකාලයේ පුස්තකාලයාධිපතිතුමිය විසින් "කියවමු ජීවිතය - පුස්තකාල සංවර්ධන වැඩසටහන " යන හිසින් යුතුව 2019.06.21 දිනැතිව සීතාවක ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ජීවත්වන ලේඛකයින් කැඳවා ලේඛක හමුවක් 2019.07.04 දින පෙ.ව. 09.30 ට හංවැල්ල මහජන පුස්තකාල රැස්වීම් ශාලාවේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බැවින් ඒ සඳහා 607-9-111 යටතේ පුස්තකාල වැඩසටහන් සඳහා වෙන්කර ඇති මුදලින් රු. 7500/- ක පමණ මුදලක් ලබාදෙන ලෙස ඉල්ලමින් යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා 607-9-111 යටතේ පුස්තකාල වැඩසටහන් සඳහා වෙන්කර ඇති මුදලින් රු. 7500/- ක මුදලක් ලබාදීමට අනුමැතිය ලබාදෙන ලදි.

4. පළාත් පාලන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත) විසින් " 'රණවිරුවෙකුට පොතක්'පොත් ව්යා.පෘතිය - 2019" යන හිසින් යුතුව අංක LGD/03/01/04 – (පොත් මිලදී ගැනීම්) යටතේ 2019.06.11 දිනැතිව 30 වසරක කුරිරු යුද්ධයෙන් සදාකාලික අබාධිත තත්වයට පත් සෙබළුන් ප්ර9තිකාර ලබන රාගම, රණවිරු සෙවන පුනරුත්ථාපන රෝහලේ බස්නාහිර පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ ප්රබධානත්වයෙන් පුස්තකාලයක් ආරම්භ කිරීමට බස්නාහිර පළාතේ පළාත් පාලන පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමය තීරණය කර ඇති බැවින් ඉතිහාසය, මනෝවිද්යාලව හා මානසික සංවර්ධනය, නව කතා, කෙටිකතා, බුද්ධාගම, කාව්යා සංග්රරහය, සෞඛ්ය0 හා පෝෂණය යන විෂයන් සම්බන්ධ කෘතීන් පහත සඳහන් මධ්ය ස්ථාන වෙත එම දුරකතන අංක අමතා පරිත්යාගයන් ලබාදෙන ලෙස දක්වමින් යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා සියලුම මන්ත්රීලවරුන් දැනුවත් කර ඔවුන්ගේ දායකත්වය ලබාගැනීමට ද, සභාව සතු සියලුම පුස්තකාල මඟින් පොත් ලබාගැනීමට ද තීරණය කළ අතර මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම සඳහා හංවැල්ල මහජන පුස්තකාලයේ පුස්තකාලයාධිපතිතුමිය මඟින් සිදුකිරීමට තීරණය කරන ලදි.

| මධ්යලස්ථානය | නම | දුරකතන අංකය |
|---|---|---|
| කිරුළපන මහජන පුස්තකාලය හයිලෙවල් පාර, කිරුළපන | එල්.පී.කේ. උදයනාථ මහතා | 0718051157 |
| හොරණ මහජන පුස්තකාලය, හොරණ, නගර සභාව | සුනේත්රා, හේමමාලි මහත්මිය | 0702578553 |
| ගම්පහ මහජන පුස්තකාලය, ගම්පහ | ඩී.එම්.ඩබ්.වී. ජයසිංහ මහතා | 0718275168 |

5. පාදුක්ක, මීපේ පූර්ව ළමාවිය සංවර්ධන මධ්ය ස්ථානය හා දිවා සුරැකුම් මධ්ය ස්ථානයේ පාලිකාව විසින් "ආයතනයෙහි අනාරක්ෂිත බව දැනුම් දීම. " යන හිසින් යුතුව 2019.05.09 දිනැතිව 2010 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලබන දරුවන් 38 දෙනෙකු පමණ අධ්යායපනය හදාරන මෙම පෙර පාසල තුළ පහත හේතූන් මත අනාරක්ෂිත තත්වයක් පවතින බැවින් හැකි ඉක්මණින් සුදුසු ක්රි යාමාර්ගයන් යෙදීමට කටයුතු සලසා දෙන ලෙස ඉල්ලමින් යොමුකරන ලද ලිපියට අදාලව දැනට තණකොළ කපා පිරිසිදු කර ඇති අතර වාහන හැරවීම හා නැවැත්වීම වැළැක්වීම සඳහා තාවකාලික වැටක් ඉදිකර එම වැට හරහා පොදු වැසිකිළිය හා පෙර පාසලේ ඉඩම වෙන්කර ඇති බවත් දිවා සුරැකුම් මධ්ය ස්ථානයේ ලියාපදිංචි කිරීම හා ප්රේමිතිය සම්බන්ධ ගැටළු ප්රලජා සංවර්ධන නිළධාරීතුමිය වෙත දැන්වීම සුදුසු බවට ඉදිරිපත් කරන ලද තාක්ෂණ නිළධාරී වාර්තාව හා පෙර පාසලේ ආරක්ෂිත වැට සකස් කිරීම සඳහා සකස් කරන ලද ඇස්තමේන්තු ද සමඟ ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා තාක්ෂණ නිළධාරී ලබාදුන් වාර්තාව අනුව සම්පූර්ණ කර නොමැති අඩුපාඩු සකස් කිරීමට තීරණය කරන ලදි.

i. ආරක්ෂිත වැටක් ගේට්ටුවක් නොමැත.
ii. නාම පුවරුවක් නොමැත.
iii. නිතර නිතර විවිධ පුද්ගලයන් පොදු වැසිකිළියට පැමිණේ. (එහි අසභ්යු සිදුවීම් ද සිදුවේ.)

iv. සවසට පිට්ටනියේ විවිධ පුද්ගලයන් මත්පැන් පාවිච්චි කර බෝතල්, බියර් ටින් දමා යයි.

v. ජ්රජා ශාලා භූමියට පැමිණ විවිධ වාහන හරවා යයි. ඒ ලෙසම එහි විවිධ වාහන දමා යයි.

6. ජ්රජා සංවර්ධන නිලධාරී විසින් "සාහිත්යව තරඟාවලිය සහ සාහිත්යය උත්සවය 2019 සංශෝධිත ඇස්තමේන්තුව (විස්තරාත්මක)" යන හිසින් යුතුව 2019.06.24 දිනැතිව 2019 ජුනි මස පැවති මහා සභා රැස්වීමේ න්යාජය පත්රායේ අංක 05 (04) අනු අංක 01 යටතේ ඉදිරිපත් කර ඇති සාහිත්යි තරඟාවලිය හා සාහිත්යය උත්සවය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුවේ සංශෝධිත ඇස්තමේන්තුව (විස්තරාත්මක) කාරක සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

| අනු අංක | විස්තරය | මුදල (රු.) |
|---|---|---|
| 1 | තරඟ විනිශ්චය<br>කථික (කනිෂ්ඨ, ජ්යෙ ෂ්ඨ, ජ්යෙෂ්ඨ ද්විතීය තිදෙනෙකු සඳහා)<br>රු. 2000.00 x 3 = 6000.00 | 26,000.00 |
| | ගායන (කනිෂ්ඨ, ජ්යෙෂ්ඨ, ජ්යෙෂ්ඨ ද්විතීය තිදෙනෙකු සඳහා)<br>රු. 2000.00 x 3 = 6000.00 | |
| | චිත්රු (පූර්ව ප්රා. ප්රාථමික, කනිෂ්ඨ, ජ්යෙ ෂ්ඨ, ජ්යෙෂ්ඨ ද්විතීය) විනිශ්චය සඳහා දෙදෙනෙකු යොදාගනී.<br>රු. 2000.00 x 2 = 4000.00 | |
| | පද්යත රචනා (කනිෂ්ඨ, ජ්යෙෂ්ඨ, ජ්යෙෂ්ඨ ද්විතීය) = 2000.00 | |
| | ගද්යත රචනා (කනිෂ්ඨ, ජ්යෙෂ්ඨ, ජ්යෙෂ්ඨ ද්විතීය) = 2000.00 | |
| | කෙටිකතා (කනිෂ්ඨ, ජ්යෙෂ්ඨ, ජ්යෙෂ්ඨ ද්විතීය) = 2000.00 | |
| | අක්ෂර වින්යා(සය (කනිෂ්ඨ, ජ්යෙෂ්ඨ) = 2000.00 | |
| | අත් අකුරු (ප්රා ථමික) = 2000.00 | |
| 2 | තරඟ පැවැත්වෙන දින කාර්ය මණ්ඩල සංග්රමහ කටයුතු (පාදුක්ක හා හංවැල්ල වශයෙන් මධ්යස්ථාන දෙකක 30 දෙනෙකු සඳහා)<br>උදෑසන තේ සඳහා - රු. 150.00 x 30 = 4500.00 | 14,000.00 |
| | දිවා ආහාර සඳහා - රු. 180.00 x 30 = 5400.00 | |
| | අමතර වියදම් (පේපර් සර්වියට්, පේපර් ප්ලේට් වැනි) - රු.4100.00 | |
| 3 | ත්යා ග<br>2000.00 x 24 = 48,000.00 (ප්රථම ස්ථාන) | 108,000.00 |
| | 1500.00 x 24 = 36,000.00 (දෙවන ස්ථාන) | |
| | 1000.00 x 24 = 24,000.00 (තෙවන ස්ථාන) | |
| 4 | සහතික පත්ර මුද්රණය - 120 දෙනෙකු සඳහා<br>රු. 100.00 x 120 = 12,000.00 | 12,000.00 |
| 5 | කුසලාන - 22 (ප්ර ථම ස්ථාන)<br>රු. 3000.00 x 22 = 66,000.00 | 66,000.00 |
| 6 | කලාකරු උපහාර - 05 දෙනෙකු සඳහා<br>රු.5000.00 x 5 = 25,000.00 | 25,000.00 |

| | | |
|---|---|---|
| 7 | මුදල් ප්‍ර5දානයන් 05 දෙනෙකු සඳහා<br>රු. 7000.00 x 5 = 35,000.00 | 35,000.00 |
| 8 | සාහිත්‍ය0 දේශනය (මෙහිදී නර්තනාංගඥගායනාවන් සහ වාදක කණ්ඩායම් ද ඇතුලත්ව සමූහයක් මඟින් ආරාධිත දේශනය සිදුකළ හොත්) | 90,000.00 |
| 9 | සංග්‍ර0හ කටයුතු<br>උත්සව දිනයේදී 500 කගේ සහභාගීත්වය වෙනුවෙන්<br>රු. 165.00 x 500 = 82,500.00<br>උත්සවයට පෙර සැරසිලි කටයුතු සඳහා සහභාගී වන අය සඳහා සංග්‍රරහ කටයුතු 17,500.00 | 100,000.00 |
| 10 | සැරසිලි කටයුතු | 50,000.00 |
| 11 | ශබ්ද විකාශන සහ විදුලි ආලෝකකරණය | 30,000.00 |
| 12 | ඡායාරූප හා වීඩියෝකරණය | 30,000.00 |
| 13 | ආරාධනා පත්‍ර (රු. 100.00 x 250) | 25,000.00 |
| 14 | සමරු කලාප 100 (Four colour) | 60,000.00 |
| 15 | නර්තන කණ්ඩායම් සඳහා | 44,000.00 |
| 16 | අවිනිශ්චිත වියදම් | 30,000.00 |
| | මුළු එකතුව | 745,000.00 |

7. පාදුක්ක මහජන පුස්තකාලයේ පුස්තකාලයාධිපති විසින් “අඩු ආදායම්ලාභී සහ විශේෂ අවශ්‍ය තා ඇති දරුවන් සඳහා සහනාධාර ලබාදීම. ” යන හිසින් යුතුව 2019.06.22 දිනැතිව ප්‍ර දේශයේ අඩු ආදායම්ලාභී දරුවන් හා විශේෂ අවශ්‍යබතා ඇති දරුවන් 25 දෙනෙකු තෝරා ඔවුන්ගේ ජීවන තත්වය නඟා සිටුවීමේ අධ්‍යාපනික සත්ක්‍රියාවක් ලෙස එක් ළමයෙකුට රු. 1300-1500 අතර පාසැල් උපකරණ කට්ටලයක් බෙදාදීම 2019 ජුලි මස 20 වන සෙනසුරාදා දින පෙ.ව. 9.00 ට පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බැවින් ඒ සඳහා 607-9-111 යටතේ පුස්තකාල වැඩසටහන් සඳහා වෙන්කර ඇති මුදලින් රු. 37500/- ක පමණ මුදලක් ලබාදෙන ලෙස ඉල්ලමින් යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා 607-9-111 යටතේ පුස්තකාල වැඩසටහන් සඳහා වෙන්කර ඇති මුදලින් රු. 37500/- ක මුදලක් ලබාදීමට අනුමැතිය ලබාදෙන ලද අතර එම අඩු ආදායම්ලාභී දරුවන් 25 දෙනා සඳහා නොමිලේ පුස්තකාල සාමාජිකත්වය ලබාදීමට ද තීරණය කරන ලදි.

8. ප්‍ර ජා සංවර්ධන නිළධාරී විසින් “2020 වර්ෂය සඳහා සීතාවක ප්‍රාලදේශීය සභා පෙර පාසල්වලට ළමුන් ඇතළත් කිරීම. ” යන හිසින් යුතුව 2019.06.18 දිනැතිව කළුඅග්ගල, කොස්ගම, කනම්පැල්ල, පාදුක්ක, කහහේන, මාවල්ගම, සුදුවැල්ල සීතාවක ප්‍රාළදේශීය සභා පෙර පාසල්වලට 2020 වර්ෂය සඳහා ළමුන් ඇතුළත් කර ගැනීමට පහත පරිදි අයදුම්පත් නිකුත් කිරීමට හැකි බවත් මීපේ සහ හංවැල්ල දිවා සුරැකුම් මධ්‍ය ස්ථානවලට පිළිවෙලින් ළමුන් 08 සහ 10 වශයෙන් ළමුන් ඇතුළත් කරගත හැකි බවද දක්වමින් අයදුම්පත්‍රයය සමඟ යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මෙම පෙර පාසල් නොමිලයේ ක්‍රියාත්මක වන බැවින් අඩු ආදායම්ලාභී පවුල්වල

දරුවන් සඳහා අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් සාකච්ඡා කළ අතර ගරු සභාපතිතුමා සමඟ සාකච්ඡා කර ඒ අනුව කටයුතු කිරීම සුදුසු බවට තීරණය කරන ලදි.

| අනු අංක | පෙර පාසලේ නම | දැනට සිටින ළමුන් ගණන | 2020 වර්ෂය සඳහා ඉතිරිවන ළමුන් | 2020 සඳහා බඳවාගත හැකි ප්‍ර මාණය |
|---|---|---|---|---|
| 01 | පාදුක්ක පෙර පාසල | 63 | 32 | 31 |
| 02 | කොස්ගම පෙර පාසල | 60 | 24 | 36 |
| 03 | කහහේන පෙර පාසල | 25 | 12 | 20 |
| 04 | වින්සෙන්ෆ් පෙර පාසල | 23 | 10 | 20 |
| 05 | කනම්පැල්ල පෙර පාසල | 35 | 21 | 19 |
| 06 | මීපේ පෙර පාසල | 36 | 19 | 21 |
| 07 | කළුඅග්ගල පෙර පාසල | 36 | 15 | 25 |
| 08 | හංවැල්ල පෙර පාසල | 54 | 25 | 15 |
| 09 | මාවල්ගම පෙර පාසල | 23 | 16 | 20 |
| එකතුව | | 355 | 174 | 207 |

9. වග, පින්නවල, කිරිවාන, 173/2 හි පිහිටි පින්නවල දකුණ, රන්දිය ප්‍රජා මූල සංවිධානය විසින් “පින්නවල (කිරිවාන) ප්‍ර ජා ශාලාව සම්බන්ධවයි. ” යන හිසින් යුතුව 2019.05.17 දිනැතිව පින්නවල (කිරිවාන) ප්‍රදජා ශාලාව සම්බන්ධයෙන් සීතාවක ප්‍රාහදේශීය සභාව විසින් අංක 1/15/නිවාස-කමිටු/නි/19 හා 2019.02.12 දිනැතිව යවන ලද ලිපියට පිළිතුරු ලෙස එවන ලද ලිපිය සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද කාරක සභාව, අදාල ප්‍රජාශාලාව නීත්‍යානුකූලව සංවිධානයක් වෙත පවරාදීමක් කළ නොහැකි බැවින් රන්දිය ප්‍ර,ජා මූල සංවිධානයේ සභාපතිතුමාගේ ලිපිය ප්‍රකකාරව එම සංවිධානය වෙත සම්පූර්ණ අයිතිය පැවරීමට කටයුතු කළ නොහැකි බව දන්වා යැවීමට කාරක සභාව තීරණය කරන ලදි.

10. සීතාවක ප්‍රාකදේශීය සභාවට අයත් මහජන පුස්තකාල සඳහා කතුවරුන් විසින් යොමු කරන ලද පහත සඳහන් පොත් පිටපත් 5 බැගින් පුස්තකාල 5 සඳහා මිලදී ගැනීමට කමිටුව තීරණය කරන ලදී.

| | පොතේ නම | කර්තෘගේ නම | වටිනාකම |
|---|---|---|---|
| i. | දන්නවනම් හිත හැඬුව තරම් | නිශා සෙනෙවිරත්න මිය | රු. 475.00 |
| ii. | රාජ්‍යහ සේවයේ නිවාඩු සහ නිවාඩු පනත | චන්දිමාල් විජේරත්න මයා | රු. 390.00 |
| iii. | විකසිත මගෙ සිත | අනුරා ශ්‍රීෙ කුමාරි වීරසිංහ මිය | රු. 200.00 |

## සාකච්ඡා සටහන්

1. සීතාවක ප්‍රාමදේශීය සභාව වෙත පවරා නොමැති සුසාන භූමි හා පොදු පහසුකම් ඉඩම් කොටස් පවරා දෙන ලෙස පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉල්ලීමක් කිරීමට තීරණය කරන ලදි.

2. 2019.05.24 දින පැවති කාරක ‘සභාවේ තීරණ අංක 0 1 – (05) යටතේ දැක්වෙන ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය විසින් “අඩු ආදායම් ලාභීන් සඳහා වැසිකිළි ආධාර ලබා දීම - 2019” යන හිසින් යුතුව 2019.06.14 දිනැතිව යොමුකරන ලද ලිපියට අදාලව මෙම වර්ෂයේ වෙන්කර ඇති ප්‍රවතිපාදන මුදල අනුව එක් මන්ත්‍රී වරයෙකු සඳහා උපරිම වශයෙන් අයදුම්පත් 02 ක් ලබා දීමට කාරක සභාව තීරණය කරන ලදී.